රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 22/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 7.
1989 මාර්තු මස 23 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## ප්‍රසූති නිවාඩු - ආයතන සංග්‍රහය
## XII පරිච්ඡේදය.

කරුණාකර, 18 වන වගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත සඳහන් පරිදි ආදේශ කරන්න.

18. - ප්‍රසූති නිවාඩු.

18:1 - විවාහ වීමෙන් පසු සේවයෙන් විශ්‍රාම ගතයුතු නිලධාරිනියකට නීතිප්‍රකාර විවාහයකට ඇතුලත් නොවී ලැබෙන දරුවෙකු සම්බන්ධයෙන් මෙම වගන්තිය යටතේ ප්‍රසූති නිවාඩු හිමි නොවේ.

18:2 - නව මසකට නොඅඩු කාලයක් සේවය කර ඇති නිලධාරිනියකට 1 වන හා 2 වන සජීවී දරු උපත් සඳහා සම්පූර්ණ වැටුප් සහිත සති 12 ක නිවාඩුවක් හිමිවන අතර, ළමයා ඉපිද සති 4 ක් ඉක්ම යාමට මත්තෙන් යළිත් රාජකාරි භාර ගැනීමට ඉඩ නොදෙනු ඇත.

18:3 - මාස 9 ක අවම කාලයක් සේවය කර නොමැති නිලධාරිනියකට 1 වන හා 2 වන සජීවී දරු උපත් සඳහා ඇගේ සේවා කාලය හා මාස 9 යේ කාලය අතර අනුපාතයට අනුව සම්පූර්ණ වැටුප් සහිත අනුපාතික නිවාඩු දිය හැකිය.

18:4 - නව මසකට නොඅඩු කාලයක් සේවය කර ඇති නිලධාරිනියකට 1 වන හා 2 වන සජීවී දරු උපත් වලින් අනතුරුව ඊළඟ දරු උපත් සඳහා සම්පූර්ණ වැටුප් සහිත සති 6 ක නිවාඩුවක් හිමිවන අතර, ළමයා ඉපිද සති 4 ක් ඉක්ම යාමට මත්තෙන් යළිත් රාජකාරි භාර ගැනීමට ඉඩ නොදෙනු ඇත.

18:5 - මාස 9 ක අවම කාලයක් සේවය කර නොමැති නිලධාරිනියකට 1 වන හා 2 වන දරු උපත් වලින් අනතුරුව, ඊළඟ දරු උපත් සඳහා ඇගේ සේවා කාලය හා මාස 9 ක කාලය අතර අනුපාතයට අනුව සම්පූර්ණ වැටුප් සහිත අනුපාතික නිවාඩු දිය හැකිය.

18:6 - ප්‍රසූති නිවාඩු ගණන් බැලීමේදී එම නිවාඩු කාලය තුලට වැටෙන රජයේ නිවාඩු, සෙනසුරාදා සහ ඉරිදා දින ඊට ඇතුලත් කළ යුතුය.

/.. 2

18:7 – ගුරුවරියක්, තාවකාලික නිලධාරිනියක්, දෛනික වැටුප් ලබන නිලධාරිනියක්, අනියම් නිලධාරිනියක් හෝ කණිෂ්ඨ සේවිකාවක් හැර වෙනත් නිලධාරිනියක් සම්බන්ධයෙන් මෙම සම්පූර්ණ වැටුප් සහිත සති 12 / සති 6 ප්‍රසූති නිවාඩුව නිලධාරිනියට ඇති සමුච්චිත නිවාඩු වලින් (එනම් පසුගිය වර්ෂයේ විවේක නිවාඩු වලින්) සහ 10 වෙනි වගන්තිය යටතේ සඳහන් ඉකුත් විවේක නිවාඩු වලින් ඉතිරි නිවාඩු කිසිවක් ඇත්නම් එයින් අඩුකළ යුතුය. නිලධාරිනිය ප්‍රසූතිය සඳහා නිවාඩු ගත් වර්ෂයේ විවේක නිවාඩු වලින් එම නිවාඩුව අඩු නොකළ යුතුය. සම්පූර්ණ වැටුප් සහිත සති 12/ සති 6 මුළු ප්‍රසූත නිවාඩුවට සමුච්චිත හා / හෝ ඉකුත් නිවාඩු වලින් අඩු කළ නොහැකි නම්, ඉන් ඉතිරිවන කොටස එම වර්ෂය සඳහා නිලධාරිනියට හිමි සාමාන්‍ය නිවාඩුවට අතිරේක වූ සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩුවක් සේ සැලකිය යුතුය.

18:8 – ගුරුවරියක්, තාවකාලික නිලධාරිනියක්, දෛනික වැටුප් ලබන නිලධාරිනියක් අනියම් නිලධාරිනියක් හෝ කණිෂ්ඨ සේවිකාවක් සම්බන්ධයෙන් වූ කල්හි, සම්පූර්ණ වැටුප් සහිත සති 12/සති 6 ක ප්‍රසූති නිවාඩුව වර්ෂයේ සාමාන්‍ය නිවාඩුවට අතිරේකව සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩුවක් සේ සැලකිය යුතුය.

මෙම විධිවිධාන 1989.03.01 දින සිට ක්‍රියාත්මක වේ.

(සිරිල් ගමගේ)
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.